**චක්‍රලේඛ අංක: 11/2013**


මගේ අංකය / எனது இல. / My No. — RG/MBD/1/2012

ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. — 2889488, 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. — 2889491

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — info@rgd.gov.lk, rg@rgd.gov.lk


# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
## பதிவாளர் நாயகத் திணைக்களம்
## REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
**HEAD OFFICE**


තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. — 565

234/A3, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත, බත්තරමුල්ල.

234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.

234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site — www.rgd.gov.lk


දිනය / திகதி / Date: 2013/06/4

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්/දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

**<u>තැපැල් මගින් ලැබෙන උප්පැන්න, මරණ සහ විවාහ සහතික අයදුම්පත් මත කටයුතු කිරීම</u>**

විවාහ, උප්පැන්න සහ මරණ සහතිකවල පිටපත් සඳහා ගාස්තු මුදල් මගින් පමණක් ලබා ගැනීමට තීරණය වීමත් සමගම, සහතිකපත් ලබා ගැනීමට තැපැල් මගින් අයදුම් කිරීමේදී ගාස්තු ගෙවීම පිළිබඳව ගැටළු ඇතිවී තිබෙන බව මා වෙත වාර්තා වී ඇත. විවාහ, උප්පැන්න සහ මරණ සහතික ලබා ගැනීමට එම සහතික තැම්පත් කර ඇති කාර්යාලයටම යාම මහජනතාවට ප්‍රායෝගිකව අපහසු බැවින් තැපැල් මගින් විවාහ, උප්පැන්න සහ මරණ සහතික ලබා ගැනීමට පහසුකම් සැලසීම අවශ්‍ය වේ.

02. එබැවින් අයදුම්පත් තැපෑලෙන් එවන විට අදාල මුදල රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ ලංකා බැංකුවේ (පිටකොටුව ශාඛාවේ) අංක 7041650 දරණ ගිණුමට බැර වනසේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා, එම මුදල් තැම්පත් කිරීමේ රිසිට් පතක් හෝ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගත් A 86 රිසිට්පතක් අයදුම්පතට අමුණා එවිය යුතුය. මෙම අකාරවලින් මුදල් ගෙවීමට හැකි බවට මහජනයා දැනුවත් කිරීමට සුදුසු දැන්වීමක් කාර්යාලයේ ප්‍රදර්ශණය කිරීමට කාරුණිකව කටයුතු කරන්න.

03. එබැවින් තැපැල් මගින් ලැබෙන අයදුම් පත මත ක්‍රියා කිරීමේදී පහත උපදෙස් අනුගමනය කරන්න.

I. අයදුම් පත සමග රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අංක 7041650 දරණ ලංකා බැංකුවේ පිටකොටුව ශාඛාවේ ගිණුමට, නියමිත මුදල තැම්පත් කරන ලද රිසිට් පතක් අමුණා ඇති විට, නිසි පරිදි ගාස්තුව ගෙවා ඇති ලෙස සලකා ඉදිරි කටයුතු සිදු කරන්න.

II. අයදුම් පත සමග වෙනත් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට නියමිත ගාස්තුව ගෙවූ බවට සෑහීමකට පත්විය හැකි රිසිට් පතක් අමුණා ඇති විටද, නිසි පරිදි ගාස්තුව ගෙවා ඇති ලෙස සලකා ඉදිරි කටයුතු සිදු කරන්න. (A 86 රිසිට්පතේ මුදල් භාරගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මුද්‍රාව සටහන්කර තිබීම අත්‍යාවශ්‍ය වේ)

III. තවද, අයදුම් පතට නියමිත ගාස්තුව වශයෙන් අවලංගු නොකළ මුද්දර අලවා ඇති විටක වුවද, අයදුම්පත ප්‍රතික්ෂේප නොකර, නිසි පරිදි ගාස්තුව ගෙවා ඇති ලෙස සලකා ඉදිරි කටයුතු සිදු කරන්න.

03ග අයදුම්පත් භාර ගන්නා ලේඛනයේ ලැබුණ ගාස්තුව, මුදල් තැම්පත් කර ඇති බැංකු ශාඛාව/මුදල් ගෙවා ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ මුදල් තැම්පත් කර ඇති දිනය ආදි තොරතුරු සටහන් කර ගත යුතු ය. තවද, රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත මාසිකව එවන වාර්තාවේ මුද්දර මගින් ලැබී ඇති අදායමද වෙනම සඳහන් කර එවිය යුතු බව කාරුණිකව දන්වමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්

**ඩී. එම්. ගුණසේකර**
**රෙජිස්ට්‍රාර් ජනරාල්**

පිටපත් : 1) සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් - දැ.ගැ.ස.
2) කලාප භාර සියලුම සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - අ.ක.ස.
3) සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් - අ.ක.ස.